# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2216/16 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 07/2021 දරන සුරාබදු නිවේදනය

**ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය**

(52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමග කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති, 2021 පෙබරවාරි මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

2019.11.01 දිනැති අංක 2147/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ සුරාබදු නිවේදන අංක 06/2019, 2020.03.01 දිනැති අංක 2164/72 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ සුරාබදු නිවේදන අංක 01/2020, 2020.06.01 දිනැති අංක 2178/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ සුරාබදු නිවේදන අංක 03/2020, 2021.01.01 දිනැති අංක 2208/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ සුරාබදු නිවේදන අංක 01/2021 සහ 2019.06.20 දිනැති අංක 2128/30 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ සුරාබදු නිවේදන අංක 04/2019 මෙයින් පරිච්ඡින්න කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 5356 — 595 (2021/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

1. මෙම රීති 2021 සුරාබදු (ආරක්ෂිත සළකුණු) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ආරක්ෂිත සළකුණ'' යනුවෙන් හඳුන්වනු ලබන) I වන උපලේඛනයෙහි සඳහන් ආරක්ෂිත ස්ටිකරය හෝ ඩිජිටල් සළකුණ, (මෙහි මින්ම "ආඥපනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥපනතේ 32 (ඒඅ) වගන්තියේ කාර්යය සඳහා මෙම රීති මගින් නියම කරනු ලබන ආරක්ෂිත සළකුණුවල ස්වභාවය විය යුතුය.

   එසේම, II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි ඇතුළත් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත ස්ටිකරය හෝ ඩිජිටල් සළකුණ යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් පමණක් භාවිත කිරීමට බලපත්‍රලාභී නිෂ්පාදකයාගේ ඉල්ලීම අනුව අවසර දිය හැකිය.

   එසේම. තවදුරටත් II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි ඇතුළත් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත බලපත්‍රලාභී නිෂ්පාදකයාගේ ඉල්ලීම අනුව විශේෂ අවස්ථාවලදී පමණක් දැනට භාවිත කරන ආරක්ෂිත සළකුණ වෙනස් කිරීම සඳහා (මෙහි මින්මතු "කොමසාරිස් ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගෙන් අවම වශයෙන් මාස හයකට (06) පෙර පූර්ව අනුමැතියක් ලබාගත යුතු ය.

3. ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණ අලවා ඇත්නම් මිස, එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම නොකළ යුතු යඃ

   එසේම, මෙම රීති බලාත්මක වන දිනයේ දී II වන උපලේඛනයෙහි අංක 02 හා 03 හි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයක්, නිෂ්පාදනය කරනු ලබන බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් 2021 ජූනි මස 30 වැනි දිනෙන් පසුව ආරක්ෂිත සළකුණක් රහිතව II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරාබද්දට යටත් ද්‍රව්‍ය නිෂ්පාදනාගාරයෙන් පිටතට නිකුත් නොකළ යුතුය.

   එසේම, මෙම රීති බලාත්මක වන දිනයේ දී II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයක්, නිෂ්පාදනය කරනු ලබන බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් තමන් සතුව දැනටමත් පවතින II වන උපලේඛනෙයහි අංක 02 සහ 03 හි සඳහන් සුරා බද්දට යටත් ද්‍රව්‍ය මත 2021 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙර ආරක්ෂිත සළකුණ ඇලවීමට පියවර ගත යුතුය.

   එසේම, තවදුරටත් මෙම රීති බලාත්මක වන දිනයේ දී II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය තොගයන්, පවතින වෙළෙන්දන් විසින් 2021 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙර තමන් සතුව ඇති II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරා බද්දට යටත් ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණ ඇලවීමට පියවර ගත යුතුය.

4. කොමසාරිස් ජනරාල්වරයා විසින් -

   (අ) බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය වැළැක්වීම ;

   (ආ) සුරාබදු ආදයම් තවදුරටත් සුරක්ෂිත කිරීම ; සහ

   (ඇ) ව්‍යාජ මත්පැන් වැළැක්වීම,

   යන කාර්යයන් සඳහා ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ ආරක්ෂිත සළකුණ නිකුත් කිරීම සඳහා වගකිව යුතු ය.

5. (1) ආරක්ෂිත සළකුණ ලබා ගැනීමේ කාර්යය සඳහා ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අතින් (Manually) හෝ විද්‍යුත් ක්‍රමයෙන් (Electronic Method) ඉල්ලුම් කළ යුතු ය.

(2) ආනයනය හා සම්බන්ධ ලේඛන සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි එවැනි වෙනත් ලේඛන, ආරක්ෂිත සළකුණු ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

(3) ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින්, සෑම මාසයක කාල පරිච්ඡේදයක් ආරම්භවීමට පෙර, එකී ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් භාවිත කිරීමට අපේක්ෂිත ආරක්ෂිත සළකුණු ප්‍රමාණය පිළිබඳව අවම වශයෙන් දින අනූවක (90) පුරෝකථනයක් ඉදිරිපත් කළ යුතු ය.

(4) (අ) එකී ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් -

i. II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සුරාබද්ද ගෙවා නොමැති නම් ;

ii. II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යවල ලේබල හා පැකේජයන් සඳහා අනුමැතිය ලබාගෙන නොමැති නම් ;

iii. මෙහි සඳහන් රීතින්ට අනුකූල නොවේ නම් ; සහ

iv. ආඥාපනතේ විධිවිධානවලට අනුකූල නොවේ නම්,

II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ඇලවීමට ආදළ ආරක්ෂිත සළකුණ ලබා ගැනීම සඳහා වන ඉල්ලීම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(ආ) මෙම රීතියෙහි (1) වන ඡේදයේ සඳහන් ඉල්ලුම් පත්‍රය කොමසාරිස් ජනරාල්වරයා විසින්, අනුමත කිරීමෙන් පසු, ආරක්ෂිත සළකුණ ලබා ගැනීමේ කාර්යය සඳහා ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයා විසින් මෙම රීතින් හි III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු ය.

6. ආනයනකරුවෙකු සම්බන්ධයෙන් වන විටදී, අදළ ලේඛන කටයුතු අවසන් කිරීමට පෙරාතුව යම් කොන්දේසි වලට යටත්ව කොමසාරිස් ජනරාල්වරයා විසින් ආරක්ෂිත සළකුණු නිකුත් කළ හැකිය.

7. 5 වන රීතියේ (4) (ආ) ඡේදයේ සඳහන් ගාස්තු ලබා ගැනීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් අදළ එම ආරක්ෂිත සළකුණු ප්‍රමාණය ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයා වෙත නිකුත් කළ යුතු ය.

8. (1) මත්පැන් සඳහා තොග වෙළෙඳ බලපත්‍රලත් ස්ථානයන් හි දී (ර.බි. 03) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණු ඇලවීම, ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ආනයනකරු වගකිව යුතු ය.

(2) බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර තුළ දී II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණ, ඇලවීම, ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී නිෂ්පාදකයා වගකිව යුතු ය.

(3) මෙම රීතියෙහි (2) හි සඳහන් ආරක්ෂිත සළකුණු සක්‍රීය කිරීමේ වගකීම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු ය.

9. ගුවන් තොටුපොළ සහ වරායන් ඇතුළුව අනෙකුත් ස්ථානවල ක්‍රියාත්මක වන්නා වූ තීරු බදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම් වලදී ආරක්ෂිත සළකුණ ඇලවීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා රේගුව වගකිව යුතු අතර -

(අ) ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේ II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණ අලවා ඇත්නම් මිස ; සහ

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් එකී ආරක්ෂිත සළකුණ සක්‍රීය කර ඇත්නම් මිස,

II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන කිසිදු ද්‍රව්‍යයක් ගුවන් තොටුපොළ සහ වරායන් ඇතුළුව අනෙකුත් ස්ථානවල ක්‍රියාත්මක වන්නා වූ තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු නොලැබිය යුතු ය.

එසේ වුවද, මත්පැන් සඳහා තොග වෙළෙඳ බලපත්‍රය (ර.බී. 3) යටතේ II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනය කරනු ලබන ආනයනකරුවන් විසින්, තොග වෙළෙඳාමට අවසර ලත් (ර.බී. 03) බලපත්‍රලත් ස්ථානයන්හි දී සුරාබදු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ආරක්ෂිත සළකුණු ඇලවිය යුතු අතර එය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සක්‍රීය කරනු ලැබිය යුතු ය.

10. II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයක් මත අලවා ඇති ආරක්ෂිත සළකුණ එහි මුල් ලක්ෂණවලට කිසියම් වෙනසක් ඇති වන ලෙස නිරාවරණය කිරීම, පළුදු කිරීම, වෙනස් කිරීම, හානි කිරීම, විනාශ කිරීම, ඇතිල්ලීම හෝ මැකීම නොකළ යුතු ය ඃ

එසේ වුව ද, මෙම රීතිය -

(i) සද්භාවයෙන් සිදුකරන පෞද්ගලික පරිභෝජනය සඳහා ; සහ

(ii) ස්ථානීය පරිභෝජනය කිරීමේ කාර්යය සඳහා මත්පැන් විකිණීමට අවසර ලබාගත් බලපත්‍රලාභියෙකුට 1979.12.07 දිනැති අංක 66 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ අංක 661 දරන සුරාබදු නිවේදනයට අනුකූලව එක් වර්ගයකට අයත් අරක්කු බෝතල් දෙකක් පමණක් විවෘත කර තබා ගැනීමට බලයලත් අවස්ථාවක දී,

අදාළ නොවිය යුතුය.

11. ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් -

(1) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යය මත කොමසාරිස් ජනරාල්වරයා විසින්, කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පැහැදිලිව පෙනෙන ස්ථානයක ආරක්ෂිත සළකුණ ඇලවිය යුතු ය ඃ

(2) ආරක්ෂිත සළකුණ මිලදී ගැනීම, ආරක්ෂිත සළකුණුවල වියදම් දරා ගැනීම, ආරක්ෂිත සළකුණ ඇලවීමේ උපකරණවල වියදම් දරා ගැනීම. ආරක්ෂිත සළකුණ ඇලවීමේ කාර්යය සඳහා වන වියදම් දරා ගැනීම සහ එම උපකරණ ගැලපෙන පරිදි සකස් කිරීම හෝ අනුවර්තනය කිරීම, එම ආම්පන්න ගැලපෙන පරිදි සකස් කිරීම හෝ අනුවර්තනය කිරීම සහ එක් එක් නිෂ්පාදන පෙළවල්වල (Production Lines) අලුත් හෝ නවීකරණය කරන ලද පද්ධති ස්ථාපනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පරිශ්‍රයන් ඇතුළු යම් වෙනත් අදළ මෙහෙයුම් වියදම් දරාගත යුතු ය ඃ

(3) අඛණ්ඩව ඉදිරි කටයුතු සිදු කිරීමට සහ අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීමට ආරක්ෂිත සළකුණු අලවීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් අමතර උපකරණ හා උපාංග මිළදී ගත යුතු ය ඃ

(4) එකී උපකරණ සහ උපාංග හොඳ තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය ඃ

(5) ආරක්ෂිත සළකුණ ඇලවීමේ උපකරණ සහ ආරක්ෂිත සළකුණ ඇලවීමේ මෙහෙයුම් සඳහා භාවිත කරන උපාංගවල සියලුම යාන්ත්‍රික සහ මෙහෙයුම් දෝෂ සම්බන්ධයෙන් කඩිනමින් පිළියම් යෙදිය යුතු යඃ

(6) අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය වන අමතර උපකරණ සහ උපාංග සපයා ගැනීම සහ ගබඩා කිරීම කළ යුතු ය ඃ

(7) උපකරණ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් ඇති වූ වහාම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට දැන්විය යුතු ය ඃ

(8) මෙම රීතින්හි IV සහ V වන උපලේඛනවල දක්වා ඇති ආකෘතියට අනුකූලව බඩු වට්ටෝරු පොත් සහ ලේඛන පවත්වාගෙන යා යුතු ය ඃ

(9) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයන්හි වාර්ෂික නිෂ්පාදන ප්‍රමාණයන් හෝ ආනයනය කරනු ලබන ප්‍රමාණයන් පිළිබඳ පුරෝකතනයක් පිළියෙල කළ යුතුය ; සහ

(10) සුරාබදු දෙපාර්තමේන්තුව විසින් හෝ ආරක්ෂිත සළකුණ සැපයුම්කරු විසින් නිෂ්පාදනගාරයක සවි කරනු ලබන ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර, අනෙකුත් උපකරණ හා ආම්පන්න ඇතුළු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වල සුරක්ෂිතභාවයේ පූර්ණ වගකීම බලපත්‍රධාරියා විසින් දැරිය යුතු ය.

12. තවද, බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් -

(1) නිෂ්පාදන සැපයුම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක නිෂ්පාදන පෙළවල් සහ ආරක්ෂිත සළකුණ ඇලවීමේ උපකරණ ප්‍රමාණවත් සංඛ්‍යාවක් පවත්වාගෙන යා යුතු ය ; සහ

(2) කලානුරූපි වෙනස් වීම් සැලකිල්ලට ගනිමින් පුරෝකථනය කරන ලද සාමාන්‍ය ආරක්ෂිත සළකුණු ප්‍රමාණය අනුව අවම වශයෙන් දින දහයකට (10) ප්‍රමාණවත් වන පරිදි ආරක්ෂිත සළකුණු තොගයක් පවත්වාගෙන යා යුතු ය.

13. II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය දැනටමත් නිෂ්පාදනය කරන යම් බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් මෙම රීති බලාත්මක වන දිනට පෙර දින සිට දින අනූවක (90) කාලපරිච්ඡේදය ඇතුළත, මෙම රීතීන්ට අනුකූලව ආරක්ෂිත සළකුණු ඇලවීමේ උපකරණ සහ අනෙකුත් උපාංග ලබා ගැනීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

එසේම, ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට කටයුතු කළ යුතු ය.

14. (1) මෙම රීතිවල කාර්ය සඳහා මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් -

(අ) සභාපතිවරයා විය යුතු භාණ්ඩාගාර නියෝජ්‍යය ලේකම්වරයෙකු ;

(ආ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා ;

(ඇ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධරයෙකු ;

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධරයෙකු ; සහ

(ඉ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කරනු ලබන නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්.

යන නිලධාරීන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ කමිටුව" පත්කළ යුතු ය.

(2) කමිටු සාමාජිකයන් වසරක කාලයක් සිය ධූරය දැරිය යුතු අතර මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කමිටුවේ නිල කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය ;

(3) කමිටුවේ යම් රැස්වීමක් සඳහා සාමාජිකයන් තිදෙනෙකුගේ සණ පූර්ණයක් පැවතිය යුතු ය ;

(4) අවම වශයෙන් මාසයකට එක් වරක් වත් කමිටුව රැස්විය යුතු නමුත් අවශ්‍ය විය හැකි සෑම විටකම කමිටුව රැස්වීය යුතු ය ;

(5) කමිටුවේ කාර්යයන් සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය කමිටුව විසින් නියාමනය කරනු ලැබිය හැකි ය ;

(6) කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහු වෙනුවෙන් බලයලත් වෙනත් යම් නිලධරයෙකු කමිටු රැස්වීමට සහභාගි කරවා ගත හැකි ය ; සහ

(7) කමිටු රැස්වීම්වල සාකච්ඡා කරන ලද කරුණු වල දැඩි රහස්‍යභාවය පිළිබඳ සෑම විටකම කමිටු සාමාජිකයන් විසින් සහතික විය යුතු ය.

15. කමිටුවේ කාර්යයන් වන්නේ -

(අ) කලින් කලට ආරක්ෂිත සළකුණුවල ආකෘතිය සහ ස්වභාවය තීරණය කිරීම ;

(ආ) ආරක්ෂිත සළකුණ ඉල්ලුම් කිරීමේ, සැකසීමේ, ඇණවුම් කිරීමේ, මුද්‍රණය කිරීමේ, ගබඩා කිරීමේ, නිකුත් කිරීමේ හා බෙද හැරීමේ ක්‍රමවේද කලින් කලට තීරණය කිරීම ;

(ඇ) කලින් කලට ආනයනකරුවන් සහ බලපත්‍රලාභී නිෂ්පාදකයන් විසින් පවත්වාගෙන යා යුතු බඩු වට්ටෝරු පොත් සහ ලේඛනවල ආකෘති තීරණය කිරීම ;

(ඈ) ආරක්ෂිත සළකුණ පරීක්ෂා කර බැලීම සහ ඒ පිළිබඳව සොය බැලීම සම්බන්ධ ක්‍රමවේද, කාර්යය පටිපාටි සහ පිළිවෙළ කලින් කලට තීරණය කිරීම ;

(ඉ) ආරක්ෂිත සළකුණුවල විවෘත, ආවෘත සහ වෝහාරිත සළකුණු සහතික කිරීමේ ක්‍රමවේද කලින් කලට තීරණය කිරීම ;

(ඊ) ඉල්ලුම මත පදනම්ව ආරක්ෂිත සළකුණ ඇණවුම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම ;

(උ) ආරක්ෂිත සළකුණුවල භෞතික, තාක්ෂණික සහ මෙහෙයුම් කාර්ය සාධනය ඇගයීම සහ වෙනත් යම් නව නිර්දේශ ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ආරක්ෂිත සළකුණු නිර්මාණය කිරීමේ, මුද්‍රණය කිරීමේ සහ ඒ හා සම්බන්ධ වෙනත් සියලු කාර්යයන්හි ක්‍රියාවලිය හා සම්බන්ධ කරුණු හා තත්ත්වය තහවුරු කිරීම සඳහා නිසි මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දීම ;

(එ) මේ රීතිවල කාර්ය සඳහා අවශ්‍ය විය හැකි, පැවරී ඇති හෝ අනුෂාංගික වන වෙනත් යම් කර්තව්‍යයක් ඉටු කිරීම ; සහ

(ඒ) මුදල් විෂය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කාර්තුමය පදනමින් කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම.

16. ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින්, අවස්ථානෝචිත පරිදි, ස්වකීය බලපත්‍රලාභී හෝ බලයලත් පරිශ්‍රවල හෝ බන්ධිත ගුදම්වල හෝ මත්පැන් සඳහා තොග වෙළෙඳ බලපත්‍ර (ර.බී. 03) ලත් ස්ථානවල ආරක්ෂිත සළකුණු ගබඩා කිරීම සඳහා සුරක්ෂිත සහ ප්‍රමාණවත් ගබඩා පහසුකම් සැලැස්විය යුතු ය.

17. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත දැක්වෙන අවස්ථාවල දී ආඥාපනතේ 35 වන වගන්තියට අනුකූලව ආරක්ෂිත සළකුණු, ආම්පන්න, උපකරණ, වාහන හෝ ද්‍රව්‍ය තහනමට ගනු ලැබිය යුතු ය :-

(අ) ආරක්ෂිත සළකුණු ව්‍යාජ ලෙස සකස් කර ඇති අවස්ථාවක ;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාර දිය යුතු ආරක්ෂිත සළකුණු එසේ ආපසු භාර දී නොමැති ; හෝ එම ආරක්ෂිත සළකුණ ලබාදෙන ලද්දේ යම් තැනැත්තන්ට ද එම තැනැත්තන් නොවන වෙනත් යම් තැනැත්තන් සන්තකයේ තිබී එම ආරක්ෂිත සළකුණු සොයා ගනු ලැබූ අවස්ථාවක ;

(ඇ) මෙහි රීතිවල නියමයන් සපුරා නොමැති II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ගබඩා කිරීම, සැඟවීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා වාහනයක් භාවිත කර ඇති අවස්ථාවක ;

(ඈ) ව්‍යාජ ලෙස සැකසූ ආරක්ෂිත සළකුණු නිෂ්පාදනය කිරීම සඳහා උපකරණ හෝ යන්ත්‍ර භාවිත කර ඇති අවස්ථාවක ; හෝ

(ඉ) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත්වන ද්‍රව්‍ය මත ව්‍යාජ ලෙස සැකසූ ආරක්ෂිත සළකුණ ඇති අවස්ථාවක හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් වරින් වර නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූල නොවන ආකාරයෙන් අලවන ලද ආරක්ෂිත සළකුණු ඇති අවස්ථාවක හෝ මේ රීතිවලට අනුකූල පරිදි ආරක්ෂිත සළකුණු නොමැති අවස්ථාවක

(2) යම් ආරවුලක් ඇති වූ අවස්ථාවක එය විමර්ශනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කරනු ලැබිය හැක.

18. II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් පහත දැක්වෙන අවස්ථාවල දී භාවිත නොකරන ලද ආරක්ෂිත සළකුණු කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාර දිය යුතු ය :-

(අ) බලපත්‍රලාභී නිෂ්පාදකයා විසින් II වන උපලේඛනයෙහි අංක 02 සහ 03 හි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය නිස්පාදනය නැවැත්වූ අවස්ථාවක

(ආ) ආරක්ෂිත සළකුණුවල සහ රීල්වල දෝෂ ඇති අවස්ථාවක ; හෝ

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, එම ආරක්ෂිත සළකුණ භාවිත නොකළ යුතු බවට ප්‍රකාශ කර ඇති අවස්ථාවක,

19. හානි වූ ආරක්ෂිත සළකුණ බලයලත් නිලධරයෙකු විසින් ප්‍රත්‍යාක්ෂණය කිරීම සඳහා ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් සුරැකිව තබාගත යුතු ය.

20. කිසිදු ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව එකී ආනයනකරුට හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයාට නිකුත් කර ඇති ආරක්ෂිත සළකුණ එකී තැනැත්තාටම අයත් වෙනත් නිෂ්පාදන හෝ ආනයන ඒකකයකට මාරු කරනු නොලැබිය යුතු ය.

21. නව හෝ නවීකරණය කරන ලද ආරක්ෂිත සළකුණු හා ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කරන අවස්ථාවක දී, එකී නව හෝ නවීකරණය කරන ලද ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමට අවම වශයෙන් දින හැටකට (60) පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනකරුවන්ට හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයන්ට ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

22. ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් -

(අ) යම් නිෂ්පාදන පෙළවල් ක්‍රියාත්මක නොවීමක් සිදු වීමෙන් පැය විසි හතර (24)ක් ඇතුළත එම නිෂ්පාදන පොලවල් ක්‍රියාත්මක නොවීම පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ආ) පරිශ්‍රයේ ස්ථාපනය කර ඇති පද්ධතියේ සංරක්ෂණය හා ආරක්ෂාව පිළිබඳ වගකිව යුතු ය ;

(ඇ) යම් මෙහෙයුම් දෝෂයක් හෝ ආරක්ෂාව කඩවීමක් සිදු වී පැය විසිහතර (24)ක් ඇතුළත එම මෙහෙයුම් දෝෂය ගොහ් ආරක්ෂාව කඩවීම පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ඈ) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යවල ලේබල් සහ පැකේජ සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් පූර්ව අනුමැතිය ලබා තිබිය යුතු ය ;

එසේ වුවද, මෙම රීතිය තීරුබදු රහිත සාප්පු සඳහා ආනයනය කරනු ලබන II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යය සඳහා අදාළ නොවිය යුතුය ;

(ඉ) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයන් සඳහා දැනටමත් අනුමැතිය දී ඇති ලේබල හා පැකේජ ප්‍රතිනිර්මාණය කරන විට ලේබල හා පැකේජවල යම් වෙනසක් පිළිබඳ යටත් පිරිසෙයින් දින තිහකට (30) පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(ඊ) (i) අකර්මන්‍ය නිෂ්පාදන පෙළවල් නැවත සක්‍රීය කිරීමක දී,

(ii) නිෂ්පාදන පෙළවල් නිෂ්ක්‍රීය කිරීමක දී,

(iii) නඩත්තු කටයුතු සිදු කිරීමක දී හෝ නිෂ්පාදන පෙළවල් ප්‍රතිස්ථාපනය කිරීමක දී සහ

(iv) නව නිෂ්පාදන පෙළවල් ස්ථාපනය කිරීමක දී

ස්ථාපනය කිරීමට හෝ ඉවත් කිරීමට යටත් පිරිසෙයින් දින තිහකට (30) පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

23. (1) කිසිම තැනැත්තකු විසින් මෙහි සඳහන් රීති උල්ලංඝනය කරමින් -

(අ) II වන උපලේඛනයෙහි සඳහන් කරනු ලැබූ සුරාබද්දට යටත් වන යම් ද්‍රව්‍යයක අලවා ඇති ආරක්ෂිත සළකුණ මත මුද්‍රණය කිරීම් හෝ විකෘති කිරීම ;

(ආ) මේ රීති යටතේ ආරක්ෂිත සළකුණ ඇලවීමෙන් නිදහස් කළ අවස්ථාවක හැර ආරක්ෂිත සළකුණ අලවා නැති II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව ආරක්ෂිත සළකුණ ලබා ගැනීම හෝ ආරක්ෂිත සළකුණ ලබා ගැනීමට උත්සාහ කිරීම ;

(ඈ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව, ආරක්ෂිත සළකුණ මුද්‍රණය කිරීම, සෑදීම හා වෙනත් කිසියම් ආකාරයකින් නිර්මාණය හෝ ප්‍රතිනිර්මාණය කිරීම ;

(ඉ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව මුද්‍රණය කරන ලද, සාදන ලද හෝ වෙනත් යම් ආකාරයකින් ලබාගත් යම් ආරක්ෂිත සළකුණක් ළඟ තබා ගැනීම ;

(ඊ) මෙහි සඳහන් රීතින්ට අනුකූලව අලවන ලද ආරක්ෂිත සළකුණ රහිතව II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, රැගෙන යාම, ප්‍රවාහනය, බෙද හැරීම, විකිණීම හා විකිණීමට ප්‍රදර්ශනය කිරීම ; සහ

(උ) ව්‍යාජ ආරක්ෂිත සළකුණු අලවන ලද, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, රැගෙන යාම, ප්‍රවාහනය, බෙද හැරීම, විකිණීම හා විකිණීමට ප්‍රදර්ශනය කිරීම,

නොකළ යුතු ය.

24. ආරක්ෂිත සළකුණු සහ ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා මුදල් විෂය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විශේෂ විගණන කණ්ඩායමක් පත් කරනු ලැබිය හැකි ය.

25. මෙහි සඳහන් රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන්, ආඥාපනතේ 27, 47, 48, 50 සහ 56 වන වගන්තිවල විධිවිධාන අවස්ථානෝචිත පරිදි අදළ කරගත යුතු ය.

26. මේ රීතීන්හි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"සුරා බද්දට යටත් වන ද්‍රව්‍යය" යන්නට, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථයම පවතී.

"ආරක්ෂි. සළකුණ" යන්නට I වන උපලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති ආරක්ෂිත සළකුණුවල ස්වභාවය අදහස් වේ.

"ආරක්ෂිත සළකුණු කළමනාකරණ පද්ධතිය" යන්නට, ආරක්ෂිත සළකුණු කළමනාකරණය කිරීම සඳහා භාවිත කරනු ලබන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් අදහස් වේ.

"තොරතුරු" සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම්" යන්නට, පරිගණක සේවා දයකය (Server), මෘදුකාංග, මෙහෙයුම් පද්ධති, රැහැන් සහිත හා රැහැන් රහිත ජාල, ඉලෙක්ට්‍රොනික උපාංග, පර්යන්ත, සංරචක, මෙවලම් සහ අනෙකුත් අදළ වෙනත් චල්‍ය, විචල්‍ය, සක්‍රීය, අක්‍රීය හා අතින් ක්‍රියාකරන සංරචක අන්තර්ගත වේ.

"ආනයනකරු", යන්නට මෙම රීතින් හි II වන උපලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 10 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නෙකු අදහස් වේ.

"බලපත්‍රධාරී නිෂ්පාදකයෙකු" යන්නට, මෙම රීතින් හි II වන උපලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නෙකු අදහස් වේ.

"වෙළෙන්දකු", යන්නට, මෙම රීතින් හි II වන උපලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය විකිණීම. විකිණීම සඳහා සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රදර්ශනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 18 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නෙකු ද අදහස් වේ.

(2 වන රීතිය)

## I වන උපලේඛනය

| *ආරක්ෂිත උපකරණ* | *විස්තරය* |
|---|---|
| (1) ආරක්ෂිත ස්ටිකර | (i) දිග (මිමී 100), පළල (මිමී 200) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60)<br>දිග (මිමී 80), පළල (මිමී 16) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60)<br>දිග (මිමී 50), පළල (මිමී 10) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60)<br>විශ්කම්භය (මිමී 20) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60)<br>ඉහත සළකුණුවල වෙනස්වීමේ නම්‍යතාව සහිතව,<br><br>(ii) සහතික කිරීම, හඳුනා ගැනීම. පළුදු කිරීම නොහැකි වන ලෙස සකස් කිරීම සහ ඉබේ ඇලවෙන, ඉබේ විනාශවන සහ නැවත භාවිත කළ නොහැකි ස්ටිකරවල ඇතුළත් ආරක්ෂිත සළකුණු සහ වෝහරික බව, ආවෘත බව, විවෘත බව සහ ඊට අදළ අනෙකුත් ආරක්ෂිත සළකුණු.<br><br>(iii) හොලොග්‍රැෆික් ආරක්ෂිත සළකුණු |
| (2) ඩිජිටල් සළකුණ | (i) විශේෂිත අනන්‍යතාවයෙන් යුත් ආහාර ශ්‍රේණිගත කිරීමට ඇතුළත් (Food Gradable) තීන්ත (ඩිඔක්සිරයිබොනියුක්ලෙයික්) අම්ල (DNA අඩංගු) භාවිත කර, විශේෂිත අනන්‍යතාවයෙන් යුත් ආරක්ෂිත ඩිජිටල් අංකයක් (Unique Secure Digital Number) සහ උපකරණයක් අධාරයෙන් කියවිය හැකි විශේෂිත අනන්‍යතාවයෙන් යුත් කේතයක (Unique Machine Readable Code) සංකලයනක් (Combination) සහිත ඩිජිටල් සළකුණ.<br><br>(ii) ඩිජිටල් තාක්ෂණය මගින් සහතික කිරීම හා හඳුනා ගැනීම ඇතුළත් ආරක්ෂිත සළකුණු සහ වෝහාරික බව, ආවෘත බව, විවෘත බව සහ ඊට අදළ ලක්ෂණ ඇතුළත් සළකුණු |

(3 වන රීතිය)

## II වන උපලේඛනය

| *අංකය* | *වර්ගය* |
|---|---|
| 01 | ආනයනික විදේශීය මත්පැන් |
| 02 | දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් |
| 03 | දේශීය මත්පැන් |

(5 (4) (ආ) වන රීතිය)

## III වන උපලේඛනය

| *අංකය* | *වර්ගය* | *ගාස්තු (රුපියල්)* |
|---|---|---|
| 01 | එක් ආරක්ෂිත සළකුණකට | 2.00 |

(11 (8) වන රීතිය)

## IV වන උපලේඛනය

### ආරක්ෂිත සළකුණු පිළිබඳ බඩු වට්ටෝරුව

| දිනය | ඇතැති ආරක්ෂිත සළකුණු ප්‍රමාණය | ලැබූ ආරක්ෂිත සළකුණු ප්‍රමාණය | බෝතල්කළ හෝ ආනයනය කළ මත්පැන සඳහා නිකුත් කළ ආරක්ෂිත සළකුණු ප්‍රමාණය | හානි වූ ආරක්ෂිත සළකුණ ප්‍රමාණය | සක්‍රීය කරනු ලැබූ ආරක්ෂිත සළකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

(11 (8) රීතිය)

## V වන උපලේඛනය

### හානි වූ ආරක්ෂිත සළකුණු පිළිබඳ බඩු වට්ටෝරුව

| හානි වූ ආරක්ෂිත සළකුණු ප්‍රමාණය | හානි වූ ආරක්ෂිත සළකුණුවල කාණ්ඩ අංක | විනාශ කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලිපියේ අංකය සහ දිනය | හානි වූ ආරක්ෂිත සළකුණු විනාශ කරන දිනය | හානි වූ ආරක්ෂිත සළකුණු විනාශ කිරීමේ කාර්යයේ නියුතු නිලධරයන්ගේ නම් තනතුරු/අත්සන් | නියෝජිතයා හෝ බලපත්‍රලාභියාගේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

04 - 144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.